3 වන පිටෙන්

**මහත් අවාසනාවක් වූයේ ආරම්භයේ සිටම (ජනාධිපති ධුරයට පත්වීමේ සිටම) මෛත්‍රීපාල සිරිසේන රහසිගත දේශපාලන න්‍යාය පත්‍රයක් සහිතව, ජනතා අභිලාෂය නිශේධනය වන ආකාරයෙන් කටයුතු කිරීමය.**

සමරුවට සහභාගි වූවන් මන්මත් කරවන තවත් සුකොමළ සහ සංවේදී ප්‍රකාශන රාශියක්ද සිරිසේන මහතාගේ කතාවේ ඇතුළත් වුවද ඉහතින් දක්වන ලද කොටස් කිහිපය පමණක් උපුටා දැක්වීමට හේතුව ඔහුගේ වත්මන් දේශපාලන භූමිකාවේ ස්වාභාවය පිළිබඳ 2015 ජනවාරි 08 වෙනිදා ඔහුට ඡන්දය දුන් හැට දෙලක්ෂ දාහත් දහසකට අධික ජනතාවට වඩාත් වැදගත් වන්නේ එම කොටස් වන බැවිනි. මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ අදාහන උත්සව අවස්ථාවේදී කළ කතාවෙන් පසුව 'ජනවාරි 8 ජනතා න්‍යාය පත්‍රය' ඉටු කිරීමට තමන්ට ඇති බැඳීම හෝ සූදානම ගැන සිරිසේන ජනාධිපතිවරයාගේ කතා පැවැත්වීම් අවසන්ව ඇති බැවිනි.

ජනවාරි 8 ජයග්‍රහණයෙන් පැය විසිහතරක් ගතවෙන්නටත් ප්‍රථම ඔහු කාටත් හොර රහසේ මහින්ද අමරවීරගේ නිවෙසට ගොස් රාජපක්ෂ පවුලේ සාමාජිකයන් හමුවී ඔවුන්ගේ ආරක්ෂාව සළසන බවට ප්‍රතිඥා දීමේ සිට ශ්‍රීලනිප සභාපති ධුරයද භාරගෙන හැට දෙලක්ෂයේ ජනවරමට පිටුපෑ ආකාරය තවදුරටත් ජනතාවට රහසක් නොවේ. එහෙත් ඔහු ජනාධිපති ධුරයට පත්කළ ජනතාව ඉවසා බලා සිටියේ ජනතා න්‍යාය පත්‍රයේ අවසන් බලාපොරොත්තුව වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කිරීමට හෝ ඔහු ක්‍රියාකරනු ඇතැයි යන විශ්වාසයෙනි. එහෙත් ඔහු 66 වෙනි ශ්‍රීලනිප සමරු උත්සවයේ වේදිකාවට නැග ඉහත ආකාරයෙන් කතාවක් පවත්වන්නේ ඒ අවසන් බලාපොරොත්තුවද සුන් කිරීමෙන් පසුවය. ඒ විධායක ජනාධිපති ධුරය අහෝසි කෙරෙන ව්‍යවස්ථාවක් සම්මත කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකඟ නොමැති බව නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීමෙනි.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය ඉකුත් 31 වෙනිදා ව්‍යවස්ථා සම්පාදක මෙහෙයුම් මණ්ඩලය වෙත දැනුම් දී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට අකමැතිය. ව්‍යවස්ථා කටයුතු සම්බන්ධයෙන් වන විශේෂ අධිකරණයක් ස්ථාපිත කිරීමටද අකමැතිය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය ලෙස ප්‍රකාශයට පත් කොට ඇත්තේ වත්මන් ව්‍යවස්ථාවේ එන විධායක ජනාධිපති ධුරය තවදුරටත් පැවැතිය යුතු බවය. ව්‍යවස්ථාව අර්ථ නිරූපනය දැනට සිදුවන ආකාරයෙන්ම තවදුරටත් ශ්‍රේෂ්ඨාධිකරණය මගින්ම සිදුවිය යුතු බවය.

විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම යනු 2015 ජනවාරි 8 වෙනිදා රටේ සිදුවූ නිහඬ දේශපාලන විප්ලවයේ ප්‍රමුඛ ජනතා අභිලාෂය විය. එමෙන්ම එම විප්ලවයෙන් බලයට පත් දේශපාලන අධිකාරිය මැතිවරණ පොරොන්දුවක් ලෙස පවා ජනතාවට දුන් ප්‍රමුඛ පොරොන්දුව ද විය. ඊට හේතුවූයේ මෑත ඉතිහාසය තුළ රට පත්ව ඇති දේශපාලන විපරිණාමයට පාර කැපූ 'බුල්ඩෝසරය' විධායක ජනාධිපති ක්‍රමය වීමය. ආරම්භයේ සිටම එම සුපිරි බල අධිකාරිය ඉදිරියට ගමන් කළේ එතෙක් රටේ පැවැති සකළ විධ දේශපාලන සහ සංස්කෘතික හර පද්ධතීන්, වටිනාකම් සහ සාරධර්ම බුල්ඩෝසර් කරමිනි.



'ජනවාරි 8' විප්ලවයෙන් ජනතාව නව දේශපාලන අධිකාරීන් දෙකක් බලයට පත්කරනු ලැබීය. ඒ, පළමුව මෛත්‍රීපාල සිරිසේන විධායක ජනාධිපති සහ දෙවනුව රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි. හැට දෙලක්ෂ දාහත් දහසක්ද ඉක්ම ගිය රටේ බහුතර ජනතාවක් මේ දේශපාලන බල අධිකාරිය ස්ථාපිත කරන්නට ඡන්දය දුන්නේ රට තුළ නව ශීලාචාර දේශපාලන සංස්කෘතියක් බිහිකරගැනීම සඳහා අවශ්‍ය මූලික වෙනස්කම් සිදුකරගැනීමේ අපේක්ෂාවෙනි. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකාංග තහවුරු කෙරෙන ආකාරයෙන් නීතියේ අධිපතිත්වය නැවත ස්ථාපිත කිරීම, තිස් වසරක් රටේ පැවැති යුද්ධයට තුඩු දුන් දේශපාලන හේතු කාරණා සමථයකට පත්කොට දිගු කාලීන සාමයක් සහ සංහිඳියාවක් ඇති කිරීමට පියවර ගැනීම, සමානුපාතික ඡන්ද ක්‍රමය මත පිහිටි මැතිවරණ ක්‍රමය වෙනුවට වඩා සුදුසු මැතිවරණ ක්‍රමයක් හඳුන්වාදීම එම මූලික වෙනස්කම්ය. අවශේෂ කාරණා යම් ප්‍රමාණයක්ද විය.

ඒ සඳහා වන අභිලාෂයන් ජනතාව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළහ. බලයට පත් පාර්ශ්ව දෙකම ඒවා ඉටු කරන බවට ප්‍රසිද්ධියේ සපථ කළහ. අද මෛත්‍රීපාල සිරිසේන රටේ ජනාධිපති බවට පත්ව සිටින්නේත්, රනිල් වික්‍රමසිංහ අගමැති බවට පත්ව සිටින්නේත් එම සංගතියේ ප්‍රතිඵලයක් ලෙසටය. ඔවුන්ගේ පරම දේශපාලන වගකීම විය යුත්තේ ජනතාවට දුන් එම දේශපාලන පොරොන්දු ඉටු කිරීමය.

මහත් අවාසනාවක් වූයේ ආරම්භයේ සිටම (ජනාධිපති ධුරයට පත්වීමේ සිටම) මෛත්‍රීපාල සිරිසේන රහසිගත දේශපාලන න්‍යාය පත්‍රයක් සහිතව, ජනතා අභිලාෂය නිශේධනය වන ආකාරයෙන් කටයුතු කිරීමය. පසුව රනිල් වික්‍රමසිංහද ඒ පාරේම ගමන් කරන්නට විය. ජනතා අභිලාෂය කෙරෙහි මෛත්‍රීට වඩා රනිල්ගේ යම් සැලකිල්ලක් ඇති බව පෙනෙන්නට තිබුණද 'යහපාලනය' නමින් හෞතීස්ම කොට ගනු ලැබූ 'මෛත්‍රීපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ පාලනය' තවදුරටත් ගමන් කරන්නට වූයේ එතෙක් රට ඉදිරියට ආ පීල්ලේමය.
ඒ අතර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා වන වැඩ පිළිවෙළක් ආරම්භ වන්නේ ඒ සම්බන්ධයෙන් පුරවැසි සමාජයෙන් එල්ල වූ දැඩි බලපෑම් හේතුවෙනි. පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් බවට පත් කෙරෙන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා වන පළමු පියවර වශයෙනි. එය සිදුවන්නේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවල එකඟත්වයෙනි.

දෙවනුව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය වෙනුවෙන් මූලික කටයුතු සිදුකිරීම සඳහා විශේෂඥ දැනුමක් ඇති පිරිසකගෙන් සමන්විත 'මෙහෙයුම් මණ්ඩලයක්' පත් කෙරුණු අතර එයට සහාය වනු පිණිස, අනුකමිටු ගණනාවක් ඇති කළේය. සමගාමීව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා මහජන අදහස් විමසීමේ වැඩ පිළිවෙළක්ද ක්‍රියාවට නැඟිණ. මාස කිහිපයක් ඇවෑමෙන් මහජන අදහස් විමසීමේ කමිටුව සකස් කළ වාර්තාව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට ඉදිරිපත් කෙරුණි. අනතුරුව එහි ඇතුළත් කරුණුද, අනුකමිටු යෝජනාද සැළකිල්ලට ගනිමින් (එසේ කළ බව කියති. එහෙත් එය එසේම සිදුවූවාදැයි අපැහැදිලිය.) මෙහෙයුම් මණ්ඩලය රැස්වී නව ව්‍යවස්ථාවක් සඳහා වන මූලික යෝජනා මාලාවක් සකස් කිරීම ආරම්භ කළේය.

මේ වන විට මෙහෙයුම් මණ්ඩලය ඒ සඳහා වාර හැත්තෑවක් පමණ රැස්වී සාකච්ඡා පවත්වා තිබිණ. ආරම්භයේ සිටම බරපතල විවාදාත්මක කාරණා බවට පත්ව තිබූ රාජ්‍යයේ ස්වාභාවය, බුද්ධාගමට ව්‍යවස්ථාවෙන් හිමිවන ස්ථානය, නව මැතිවරණ ක්‍රමය ආදී කරුණු පිළිබඳ සියලු පක්ෂ එහිදී එකඟත්වයකට පැමිණ තිබිණ. ඒකීය රාජ්‍යයක් ලෙස තවදුරටත් රට පවත්වාගනිමින් වඩා පුළුල් බලය බෙදීමත්, වත්මන් ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට හිමි තැන ඒ ආකාරයෙන්ම ඉදිරියටත් පවත්වා ගැනීමත්, සමානුපාතික සහ කොට්ඨාශ ක්‍රමය එක්කරන ලද නව මැතිවරණ ක්‍රමයක් ඇති කිරීමත් එලෙස ඇති කරගත් එකඟතාවන්ය. විවාදාත්මක කරුණු පිළිබඳ මේ ආකාරයේ එකඟත්වයකට පැමිණීමෙන් පසු එකඟතා ඇති කරගැනීමට ඉතිරිව තිබුණේ එතරම් විවාදාත්මක හෝ ගැටළුකාරී නොවන කරුණුය. එබැවින් අගෝස්තු මාසය අවසන් වීමට පෙර මෙහෙයුම් කමිටුවේ යෝජනා මාලාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, පාර්ලිමේන්තුවේ මාස කිහිපයක් හෝ සංවාද කොට අවශ්‍ය සංශෝධන වෙතොත් සිදුකොට සම්මත කරගැනීමෙන් පසු දෙසැම්බර් මාසය වන විට ජනමත විචාරණයක් පවත්වා නව ව්‍යවස්ථාව සඳහා ජනතා අනුමැතිය ලබාගැනීමටත් හැකිවේයැයිද ගනන් බලා තිබිණ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා වන සිය ස්ථාවරය මෙහෙයුම් කමිටුවට දන්වන්නේ කටයුතු මේ ආකාරයෙන් තාර්කික අවසානයක් කරා එළැඹෙමින් තිබියදීය. එම ස්ථාවරය අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනයේ මූලික අරමුණටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධය. ද්වීතියව සාධණීය සෙසු අරමුණුවලටද විරුද්ධය.

ශ්‍රීලනිපයේ එම ස්ථාවරයත් සමඟ මෙතෙක් ඉදිරියට පැමිණි නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ වැඩ පිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙනයා නොහැකි කඩඉමක සිරවීම වැළැක්විය නොහැකිය. එනම් නව ව්‍යවස්ථා කෙටුම්පතකට පාර්ලිමේන්තුවෙන් ලබාගත යුතු තුනෙන් දෙකක බහුතර ඡන්දය ලබාගැනීමේ කඩ ඉමය. වත්මන් පාර්ලිමේන්තුවේ නියෝජනය අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දය නොලැබෙන්නේ නම් තුනෙන් දෙකක් ලබාගැනීමට හැකියාවක් නැත. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයකින් අනුමත නොවන්නේ නම් නව ව්‍යවස්ථාව එතනින් ඉදිරියට අඟලක් හෝ ගෙනයාමට හැකියාවක් ඇත්තේද නැත.

'ජනවාරි 8' ජනතාව වසර තුනකට ආසන්න කාලයක් සිදුවන්නේ කුමක්දැයි නිහඬව බලා සිටියා මිස සිදුවන දේ සිය අභිලාෂයන් හා සමපාත කරගැනීමට සැළකිය යුතු ප්‍රමාණයක මැදිහත්වීමක් කළේ යැයි අපි නොසිතමු. එවැනි තත්තවයක් ඇතිවීමට තුඩු දුන් හේතු කාරණා බොහෝය. කෙසේ වුවද එහි අවසන් ප්‍රතිපලය වූයේ 'ජනවාරි 8' ජනතා විප්ලවයට නායකත්වය දුන් පුද්ගලයන්ම ප්‍රතිවිප්ලවකටද නායක්වය දීමය.

එළැඹී ඇත්තේ එහි කූඨප්‍රාප්තියයි. මාදුළුවාවේ සෝභිත හිමියන්ගෙන් ගිළිහුණු ධජය යළි එසවීමට පුරවැසි ප්‍රජාව කඩිනමින් පෙළ නොගැසුණ හොත් 'ජනවාරි 8 ජනතා ජයග්‍රහණය' පූර්ණ වශයෙන් ප්‍රතිවිලවය විසින් පරාජයට පත් කරනු නොවැළැක්විය හැකිය. විප්ලවයට නායකත්වය දුන් පුද්ගලයාම ප්‍රතිවිප්ලවයටද නායකත්වය දෙන්නා බවට පත්ව ඇති හෙයිනි.

-ශ්‍රීලාල් සෙනෙවිරත්න